මාධ්‍ය නිවේදනය

Nestlé Good Food, Good Life

2019 ජනවාරි 16, කොළඹදී...

# මයිලෝ අඛණ්ඩව සිව්වැනි වරටත් දැවැන්ත බයිසිකල් සවාරියක් සමඟින් නව වසර අරඹයි

*ක්‍රියාශීලී දිවිපෙවෙතක වටිනාකම කියාදෙමින් ළමුන් 1,000කට මවුන්ටන් බයිසිකල් පිරිනැමේ*

නීරෝගීමත් අනාගත පරපුරක් බිහිකිරීමෙහිලා මයිලෝ අරමුණින්, යළිත් වරක් ළමුන් 1,000කට මවුන්ටන් බයිසිකල් ලබාදෙමින් 'මවුන්ටන් බයිසිකල් 1,000ක්' දිනාගැනීමේ මයිලෝ ප්‍රවර්ධන වැඩසටහනේ සමාප්තිය සැමරීම සඳහා පැවැත්වූ මයිලෝ මවුන්ටන් බයිසිකල් සවාරියට සහභාගී වීමේ වරම් ජයග්‍රාහී ළමුන්ටත් ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ටත් පසුගියදා උදාවිය. ඉකුත් වසරේ ඔක්තෝබර් මාසයේ පැවැති සූරන කාඩ්පත් දිනුම් ඇදීමකින් මෙම ජයග්‍රාහකයින් තෝරාගනු ලැබිණි. ඒ අනුව බයිසිකල් සවාරිය 2019 ජනවාරි 12 ක්‍රීඩා අමාත්‍යාංශ ක්‍රීඩාංගණ පරිශ්‍රයෙන් ආරම්භ විය. සවාරියට එක්වන්නන් කොළඹ නගරය හරහා පාපැදි ධාවනය කරමින් නැවතත් ආරම්භක ස්ථානයේදී සවාරිය නිමකළහ. ඊට සමගාමීව විනෝද අවස්ථා රැසක් සමග දැවැන්ත සැණකෙළියක් පැවැත්වුණි. සෞඛ්‍යමත් ආහාර පුරුදු හා ක්‍රියාශීලී ජීවන රටාවක වැදගත්කම වටහාගැනීමට මෙන්ම තම පවුලේ සාමාජිකයන් සමඟ බැඳීම් වර්ධනය කරගැනීමට දරුවන්ට එහිදී කදිම අවස්ථාවක් උදාවිය.

බයිසිකල් සවාරියට සමගාමීව දරුවන් මෙන්ම මව්වරුන් සඳහා උදෑසන ආහාරයේ ඇති වැදගත්කම පහදාදෙමින් රසයෙන් මෙන්ම ගුණයෙන් යුතු උදෑසන ආහාරයක් දිනපතා ලබාගැනීමට ඔවුන් දිරිමත් කිරීමේ වැඩසටහනක් ද පැවැත්විණි. එහිදී අවසානයේ රසගුණ පිරි උදෑසන ආහාරයක් ලබාගැනීමේ අරමුණ වෙනුවෙන් ප්‍රතිඥා ලබාගැනීමක් ද සිදුවිය. ඊට අමතරව විවිධ විනෝද ක්‍රියාකාරකම්, ඉදිරිපත් කිරීම්, සංගීතය, ආහාරපාන සහ මයිලෝ පානය සමඟින් ද වැඩසටහන වර්ණවත් වී තිබුණි.

"උසස් පෝෂණය හා ක්‍රියාශීලී ජීවන රටාවක අවශ්‍යතාවය පිළිබඳ නිරන්තරයෙන් කතාබහ කරන සන්නාමයක් වශයෙන් අපගේ අතිශය ජනප්‍රිය මවුන්ටන් බයිසිකල් 1,000ක් දිනාගැනීමේ වැඩසටහන අපි නැවතත් ක්‍රියාත්මක කළා. මීට පෙර අවස්ථා මෙන්ම මෙවරත් ක්‍රියාශීලී ජීවන රටාවක් පවත්වාගනිමින් විනෝද වීමේ අවස්ථාව පිළිබඳව දරුවන්ට පෙන්වා දීමේ අරමුණින් දැවැන්ත බයිසිකල් සවාරියක් අපි සූදානම් කළා. ඒ නිසා අලුත් අවුරුද්දක් උදා වූ මේ මොහොතේදී බොහෝ දරුවන්ගේ ආදරය දිනාගත් ක්‍රියාකාරකමක් වන බයිසිකල් ධාවනය තුළින් නීරෝගීමත් ජීවන රටාවක් සඳහා ළමුන්වත් ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්වත් දිරිමත් කිරීම අපේ බලාපොරොත්තුවයි. අඛණ්ඩව සිව්වැනි වරටත් පැවැත්වූ අපගේ ප්‍රවර්ධන වැඩසටහන සඳහා පාරිභෝගිකයින්ගෙන් ලැබුණු ප්‍රතිචාර ගැනත් ඉතා ප්‍රමෝදයට පත්විය හැකියි. මයිලෝ සන්නාමයත් පාරිභෝගිකයිනුත් අතර අප පිළිබඳව ඇති විශ්වාසයත් ආදරයත් ඉන් මනාව පිළිබිඹු වෙනවා" නෙස්ලේ පාන වර්ග අංශයේ අලෙවි කළමනාකරු මොහොමඩ් අලි මහතා පැවසීය.

ලොව ප්‍රමුඛතම චොකලට් මෝල්ට් පානය වන මයිලෝ, විටමින් හා ඛනිජ ලවණ ගුණයෙන් පරිපූර්ණය. මයිලෝ RTD (Ready-To-Drink) නිෂ්පාදනය කෙරෙන්නේ දහස් ගණනක දේශීය කිරි ගොවීන්ගෙන් ලබාගන්නා නැවුම් එළකිරිවලට, මෝල්ට් පෝෂණය හා උසස්ම කොකෝවා එක්කරමිනි. ජයගන්වන දිරිය (Fuelling the Winning Spirit) ලබාදෙන මයිලෝ, දශක තුනක් මුළුල්ලේ ලොකු කුඩා භේදයකින් තොරව මෙරට පාසල් ක්‍රීඩා ක්ෂේත්‍රයේ දියුණුව වෙනුවෙන් ද කැපවී හිඳී. පාරිභෝගිකයන් සාර්ථකත්වය කරා යන ගමනට අවශ්‍ය ශක්තිය ලබාදෙන මයිලෝ මෙරට ළමුන් සිය දහස් ගණනකට ශාරීරිකව සක්‍රීය වීමට මෙන්ම අනාගතයේ ක්‍රීඩා තරු ලෙසින් බැබලීමටත් මඟ විවර කරදී තිබේ.